**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව- 2021**
**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය, මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
**-----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)
**---------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතී,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ වෙන්දේසි ඉඩම්වලින් සභාව වෙත ලැබී තිබුණු පොදු ඉඩම් කොටස් 08ක් හා ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් ඉඩම් 04 ක වටිනාකම රු.2,246,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම්වල වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් නොවූ ඉඩම් කොටස් ගිණුමට ඇතුලත් කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. |
| (ආ) | සභාව සතු ඉඩම් 02 ක වටිනාකම රු.115,000 ක් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අදාල ඉඩම් කොටස්වල වටිනාකම ගිණුමට ඇතුලත් කරන බව දන්වමි. | |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 554/5 හා 1989/04/17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ 217 වගන්තිය ප්‍රකාරව සභාව සතු දේපල සමීක්ෂණය කළයුතු වුවත් සභාව සතු ළිං 176 ක් පිහිටි ඉඩම් තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර, රු.500,000 ක් වටිනා වැවගාව හේන තුන්මුලේ හේනේ පිහිටි ඉඩම දෙවරක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | තක්සේරුවක් සිදුකර ඉදිරි වර්ෂයේදී නිවැරදි කරමි. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි 2 ක් සංවර්ධනයට දරා තිබුණු රු.354,909 ක මුදලක් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි. | |
| (ඉ) | ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් රු.350,000ක් වටිනා ජල බවුසරය ගිණුම්ගතකර නොතිබුණු අතර, රු.315,000 ක් වටිනා සුදු යකඩ බවුසරය රු.750,000ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් රු.435,000 ක් වැඩියෙන්ද රු.1,752,000 ක් වටිනා ට්‍රැක්ටරය රු.1,650,000 ක් ලෙස රු.102,000 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරමි. | |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ජ'නල් සටහන් අංක 33 මඟින් රු.913,593 ක් වටිනා පුස්තකාල පොත් භාණ්ඩ සමීක්ෂණයකට ඉදිරිපත් නොවූ පොත් ලෙස දක්වා මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කර තිබුණි. | 2022 වර්ෂයේ ගිණුම සකසන විට නිවැරදි කරමි. | |
| (උ) | සභාව සතු තොග ගිණුම්ගත කිරීමේ දී ගබඩාවේ තිබූ තොග සමඟ සංසන්දනය කර රු.1,230,377ක් අසමාන ශේෂ ඉවත් කිරීමට කටයුතු කර තිබුණි. | ගබඩා ගිණුම්වල අඩුපාඩු ඉදිරි වර්ෂයේ ගිණුම පිළියෙල කරන විට නිවැරදි කරමි. | |
| (ඌ) | ලෙජරයේ ඇති ආයුර්වේද ගබඩා ගිණුමේ ශේෂය ගබඩාවේ භෞතික ශේෂය සමඟ නොගැළපෙන බැවින් රු.364,725 ක් මුදලක් එකතු කිරීම් කර තිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගණනය කිරීම සිදු කරමි. | |
| (එ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජාතික යන්ත්‍රෝපකරණ අධිකාරියට ගෙවිය යුතු රු.1,180,696 ක් වූ ශේෂය රු.611,712 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ණයහිමියෝ රු.568,984 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ණය අඩුවෙන් ගණනය කිරීම නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | |
| (ඔ) | ඉකුත් වර්ෂ වලට අදාලව ප්‍රතිපාදන මුදලට වඩා වැඩියෙන් ලැබී තිබුණු රු.24,739,018 ක මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයේ ආදායමට ගැනීමට කටයුතු නොකර සමුච්චිත අරමුදලට ගලපා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ ආදායමට ගැනීමට කටයුතු කරමි. | |
| (ඕ) | සමාලෝචිත වර්ෂයේ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිපාදන රු.25,497,023ක් වටිනා කර්මාන්ත 30 ක් ක්‍රියාත්මක කර නොතිබියදී එම කර්මාන්ත ණයගැති හා ණයහිමි ප්‍රාග්ධන ආදායම් හා ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරමි. | |
| (ක) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.81,268,593 ක් වුවත් එය රු.60,000,000 ක් ලෙස රු.21,268,593 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. |
| (ග) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.4,507,581 ක් වුවත්, එය රු.4,123,395ක් ලෙස රු.384,186 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.37,232,056 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.31,845,561 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් ඒකක 4,128කින් වරිපනම් හා බදු රු.6,960,585 ක් අයකර නොතිබුණු අතර අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | හිඟ අයකර ගැනීමට කටයුතු කරමි. | කඩිනමින් හිඟ මුදල් අයකරගත යුතුවේ. |
| | **කුලී** | | |
| (අ) | මාස 15 සිට මාස 70ක කාලයක් සඳහා මැල්සිරිපුර කඩ කාමර 8 කින් රු.986,100ක කඩ කාමර කුලියක් අයකර නොතිබුණු අතර සභාව විසින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙය 2013 වර්ෂයේ ආරම්භ කර ඇතත් ඉතා අසාර්ථක ව්‍යාපෘතියකි. එයට හේතුව මැල්සිරිපුර බස්නැවතුම්පලේ මෙම කඩකාමර ඉදිකර ඇති බැවින් පාරිභෝගිකයින් මෙම කඩ කාමර වෙත නොපැමිණේ. | ටෙන්ඩර් කැඳවා බදු දී තිබේනම් බදු මුදල් අයකරගත යුතුවේ. |
| (ආ) | මැල්සිරිපුර බස්නැවතුම්පොල කඩ කාමර පෙර ගෙවුම් ක්‍රමය යටතේ 2013 වර්ෂයේ දී බදු දී ඇති අතර, වර්ෂ 09 ක් ගතවී ඇතත්, රු. 936,516ක පෙර ගෙවුම් මුදලක් විගණන දිනය වූ 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට පැවති රු.2,155,711 ක හිඟයෙන් රු.1,219,195 ක මුදලක් ගෙවා ඇත. | එකවර ගෙවීමේ මුදල් අයකර කඩ කාමර බදුදිය යුතු වේ. එසේ නොගෙවන්නේ නම්, කඩ කාමර සභාවට ලබාගෙන නැවත ටෙන්ඩර් කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳව කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 දෘශ්‍ය අක්‍රමිකතා

------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------------- | -------------------- | ------------ |
| (අ) | 1999 වර්ෂයේ දී අක්කර 27 ක වපසරියකින් යුත් වාගොල්ල වත්ත ඉඩමෙන් පොදු කටයුතු සඳහා වෙන්කර තිබූ ඉඩම් ප්‍රමාණය පර්චස් 368.6 කි. මෙම වෙන්දේසි ඉඩමේ පර්චස් 30ක පමණ ප්‍රමාණයක හිටපු දේශපාලන අධිකාරිය විසින් 2010 වර්ෂයේ සිට පවුලක් අනවසරයෙන් පදිංචි කරවා ඇත. කට්ටි සැලසුම පරීක්ෂාවේ දී එකම ස්ථානයකින් පොදු කොටස් සඳහා ලබාදුන් ඉඩම් කැබලි 15ක් ප්‍රාදේශීය සභාව වෙත පවරා දී තිබුණද එම ඉඩම් කොටස් පොදු කටයුතු සඳහා වෙන්ව නොතිබුණි. මේ සම්බන්ධයෙන් සභාවේ වගකිවයුතු නිලධාරීන් විසින් නීතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | 1999 වර්ෂ වලදී පමණ ඉඩම් වෙන්දේසි කිරීම සම්බන්ධයෙන් ලිපිගොනු අධ්‍යනය කිරීමේදී ප්‍රාදේශීය සභාව සතු පොදු ඉඩම් කොටස් හදුනා ගැනීමට හා එවා භෞතිකව ආරක්ෂා කිරීමට විධිමත් ක්‍රම වේදයක් අනුගමනය කළ බවට තහවුරුවක් නොමැත. එම ඉඩම් කොටස් ආරක්ෂිත වැටකින් ආවරණය කර නොමැති නිසා කාලයක් යන විට පොදු ඉඩම් කොටස් වශයෙන් පවතින්නේද යන්න හදුනා ගැනීමට අපහසු වේ. | සභාවට පවරා ඇති පොදු ඉඩම් ආරක්ෂා කිරීම ඒවා පොදු කටයුතු සඳහා ලබාදීම සභාව කළ යුතුවේ. |
| (ආ) | නාබැට හේනේගෙදර මූකලාන වෙන්දේසි ඉඩමෙන් පොදු කටයුතු සඳහා ලොට් 88 - රූඩ් 02 පර්චස් 05 ක්ද, ලොට්83 - රූඩ් 01 පර්චස් 38.9 ක් ද ලැබී තිබුණි. මෙම ඉඩම් වෙන්දේසියෙන් වෙන්කර තිබූ අංක 83 දරන ඉඩම් කොටස මඩ වගුරකින් යුතු ඉඩමක් බවත්, අංක 88 දරන ඉඩම් කොටසෙන් අධිබලැති විදුලි රැහැනක් ගමන් කරන බවත් නිරීක්ෂණය විය. එසේ තිබියදීත් ප්‍රයෝජනයකට නොමැති මෙම ඉඩම් කොටස් පොදු කටයුතු සඳහා ලබාගෙන තිබුණි. | අක්කර 05 වැඩි බිම් ප්‍රමාණයක් ඉඩම් කට්ටිකර විකිණීමේ දී පළාත් මෙහෙයුම් කමිටුවේ එකඟතාවය ලබාගත යුතුය. ඒ අනුව මෙම වෙන්දේසි ඉඩම සඳහා 2022 මාර්තු 08 දින කොන්දේසි ඇතුලත් කරමින් පළාත් මෙහෙයුම් කමිටුවේ එකඟතාවය ලබාදී ඇත. | 1952 අංක 06 දරන සම්මත අතුරු ව්‍යවස්ථාවේ 9 (2) ඡේදය ප්‍රකාරව කට්ටි කරනු ලබන ඉඩමෙන් පොදු කටයුතු සඳහා වෙන් කරනු ලබන ඉඩම් කොටස පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | නාබැට හේනේගෙදර මූකලාන ඉඩම් වෙන්දේසියෙන් සියයට 1 ක ආදායම ලබාගැනීමේ දී සත්‍ය විකුණුම් වටිනාකමට ලබාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය. වෙන්දේසි නියෝජිත ආයතනයේ පැවති ලිපිලේඛන හා ලබාගත් තොරතුරු අනුව දඹුලු කුරුණෑගල මාර්ගයට මායිම්ව ඇති බිම් | වෙන්දේසි ඉඩම්වල සියයට 1ක බදු මුදල අයකිරීමේ විවිධ ගැටළු පවතින බවට පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් අධ්‍යයන කර ඇතිබව සඳහන් කරයි. එම නිසා මේ සඳහා | සභාව විසින් වෙන්දේසි ඉඩම් වලින් සියයට 1 ක් ලබා ගැනීමේ දී සත්‍ය විකුණුම් වටිනාකම මත ආදායම ලබාගත යුතු වේ. |

| | |
|---|---|
| කොටස් රු.275,000 කටත්, මාර්ගයට ඇතින් පිහිටි බිම් කොටස් රු.205,000, රු.180,000 අතර විකිණී තිබියදී හා මිල ප්‍රදර්ශනය කර තිබියදී සියයට 1 ක විකුණුම් මත බදු ආදායම රු.1,165,112 ක් අඩුවෙන් ලබාගෙන තිබුණි. | කමිටුවක් පත්කර එම කමිටුව විසින් සිදුකරන ක්ෂේත්‍ර පරීක්ෂණය තුලින් ඉදිරිපත් කරන තක්සේරු වාර්තාවට අනුව සියයට 1ක බදු මුදල අයකර ගැනීමට තීරණය කර ඇත. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ සපිරිගමක් වැඩසටහන යටතේ කුඹුක්වැව සිට හිපච්ච දක්වා වෙල මැද මාර්ගය රු.876,642 ක මුදලකට වැඩනිමකර තිබුණි. කර්මාන්තය 2021 අගෝස්තු 04 දින භෞතික පරීක්ෂාවේදී මාර්ගයෙහි නිමාව හා කොන්ක්‍රීට් මිශ්‍රණය දුර්වල තත්ත්වයක පැවතුණි. මාර්ගයෙහි ඝනකම මිලි මීටර් 150 ක් විය යුතු වුවද පරීක්ෂා කරන ලද ස්ථාන 03 ක මාර්ගය මධ්‍යයෙහි ඝනකම මිලි මීටර 111, 130, 144 විය. | මෙම මාර්ගය ගිවිසුම්ගත සමිතිය කොන්ක්‍රීට් මාර්ගයට නැවත කොන්ක්‍රීට් ස්ථරයක් දැමීමට එකගව ඇති බවත් රැදවුම් මුදල් ගෙවා නැති බව දන්වමි. | මෙම මාර්ගය ඉංජිනේරු උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු ක්‍රියාත්මක කළ යුතුවේ. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

**4.1 පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම වෙනුවෙන් රු.6,807,732ක ප්‍රතිපාදන මුදලක් ලැබී තිබුණද එම ව්‍යාපෘතිය අවසන් කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. රු.2,810,261 ක් පුනරාවර්තන වියදම් දරා දිනකට කසල ටොන් 12 ක් පමණ රැස්කරනු ලබන නොදිරන කසල වලින් කොම්පෝස්ට් නිෂ්පාදනය නොකරන අතර ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භූමියේ වල දැමීම සිදුකර තිබුණි. මේ සඳහා සේවකයින් 15 දෙනෙකු සහ ට්‍රැක්ටර් රථ 03ක් යොදාගෙන රැස්කරනු ලබන ප්ලාස්ටික්, කාඩ්බෝඩ්, පොලිතීන් ඝණ අපද්‍රව්‍ය කලමණාකරන මධ්‍යස්ථාන භූමියේ තාවකාලිකව ඉදිකර ඇති කසල අංගනයේ ගබඩා කිරීම සිදුකර තිබුණි. විධිමත් සහ අපද්‍රව්‍ය කළමනාකරණයක් කෙරෙහි සභාවේ අවධානය යොමුකර නොතිබුණි. | පළාත් පාලන අමාත්‍යාංශය මගින් ලබාදෙන ප්‍රතිපාදන මගින් 2022 අංග සම්පූර්ණ ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයක් ඉදිකිරීමට කටයුතු කරන බව දැනුම් දෙමි. | දිරන හා නොදිරන කසල විධිමත්ව කළමනාකරණය කළ යුතු වේ. |